රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:**(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்:**(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

මගේ අංකය / எனது இல / My No: COM/Trans/වා.ස්.මා./2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.02.11

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්/
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

**ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කරන ලද අභියාචනා සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ - 2020**

ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන් විසින්, ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු යෝජනා පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ www.psc.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව 2020 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ හා සමාලෝචන කමිටු තීරණවල නිශ්චිත දිනයන් සඳහන් කර නොමැති ස්ථාන මාරුවීම් හා 2020.01.01 දින සිට 2020.02.19 දින දක්වා ක්‍රියාත්මක වන සේ අනුමත කරන ලද ස්ථාන මාරුවීම් 2020.02.20 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. තවද ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීම සඳහා 2020.02.20 දිනට පසු වෙනත් නිශ්චිත දිනයක් සඳහන් කර ඇති ස්ථාන මාරුවීම් එම නිශ්චිත දින සිටම අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අදාළ නිලධරයාට දන්වා ඒ අනුව ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වමි.

එස් .ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.